# අපට වෙච්ච දේ හා ඉන් ගොඩ එම

දැනට වසර හතළිහකට ඉහත මෙරට සිදු වූ කුමන්ත්‍රණය පිළිබඳ අද බොහෝ දෙනාට අමතක වී ඇත. එදා පැවති සිරිමා බණ්ඩාරනායක ආණ්ඩුව විසින් පාසල් රජයට ගැනීමෙන් පසුව මේ කුමන්ත්‍රණය සිදු විය. කුමන්ත්‍රණයෙහි නායකත්වය දැරුවෝ හමුදාවේ උසස් නිලධාරියකු වූ සේරම් මහතා හා උසස් පොලිස් නිලධාරියකු වූ සී. සී. දිසානායක මහතා ය. ඒ දෙදෙනා පිළිවෙළින් ශ්‍රීමනී ඇතුළත්මුදලි මහත්මියගේ හා රවි කරුණානායක මහතාගේ ඥාතිහු වූහ. ඔවුන් දෙදෙනාට අමතරව කුමන්ත්‍රණයට සහභාගි වූවෝ ද හමුදා හා පොලිස් නිලධාරීහු ය. ඔවුහු සියල්ලෝම ක්‍රිස්තියානි හා කතෝලික භක්තිමත්තු වූහ. පසුව පොලිස්පතිවරයකු වූ ස්ටැන්ලි සේනානායක මහතා විසින් සපයන ලද තොරතුරු අනුව ක්‍රියාත්මක වූ ආණ්ඩුවට කුමන්ත්‍රණය පරාජය කර කුමන්ත්‍රණකරුවන් අත් අඩංගුවට ගැනීමට හැකි විය. අධිකරණය ඉදිරියට පමුණුවන ලද කුමන්ත්‍රණකරුවෝ වැරදිකරුවෝ වූහ. එහෙත් එවකට පැවති නීතිය අනුව ඔවුන්ට බ්‍රිතාන්‍යයේ සාමි මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි විය. අභියාචනයෙන් කුමන්ත්‍රණකරුවෝ නීතිමය ප්‍රශ්නයක් උඩ (ක්‍රියාව සම්බන්ධයෙන් නොව) නිවැරදිකරුවෝ වූහ.

මෙරට අධිකරණය ඉක්මවා යන බලතල සහිත අධිකරණයක් එදා බ්‍රිතාන්‍යයේ විය. මා මේ කරුණ සඳහන් කෙළේ කරුණු කිහිපයක් හේතුකොට ගෙන ය. අද කිසිවකුටවත් බ්‍රිතාන්‍යයට අභියාචනා ඉදිරිපත් කළ හැකි නොවේ. 1972 ව්‍යවස්ථාවට අනුව මෙරට ජනරජයක් බවට පත් විය. ඒ සමග බ්‍රිතාන්‍යයේ රැජින තවදුරටත් අපේ රැජින නොවූවාය. 1972 ව්‍යවස්ථාවෙන් බුදු සසුන ආරක්ෂා කිරීමට රජය බැඳී ඇත. බොහෝ කරුණු අතින් ගත්කල සිංහල බෞද්ධයන් බටහිර ක්‍රිස්තියානි ආධිපත්‍යයට එරෙහිව (මගේ විරුද්ධත්වය ක්‍රිස්තියානි ආධිපත්‍යයට මිස ක්‍රිස්තියානි ආගමට හෝ සාමාන්‍ය ක්‍රිස්තියානි බැතිමතුන්ට නොවේ.) යම් යම් දෑ දිනා ගැනීම 1972න් කෙළවර විය. ඉන්පසු ඒ දිනාගත් දෑ එකින් එක නැති වී ගොස් අද අප සිටින්නේ 1956ට නොව 1947ට එහා පැත්තේ ය. මේ සිදු වූ ආකාරය අප දැනගත යුත්තේ ඉන් පාඩම් ඉගෙන ගැනීමට ය.

1815 අප බ්‍රිතාන්‍යයන් සමග ඇතිකර ගත් ගිවිසුමට අනුව බ්‍රිතාන්‍යයෝ බුදු සසුන ආරක්ෂා කිරීමටත් සිංහල නීතිය අනුව රට කරවීමටත් බැඳී සිටියහ. එහෙත් බ්‍රිතාන්‍යයෝ ගිවිසුම කඩා දැමූහ. එහි ප්‍රතිඵලයක් ලෙස 1817-18 පළමු නිදහස් සටන ඇතිවිය. 1815 ගිවිසුම අනුව බොහෝ සිංහල නායකයෝ බ්‍රිතාන්‍යයන් විශ්වාස කරමින් ඔවුන්ට සේවය කළහ. කැප්පෙටිපොළ දිසාව පවා බ්‍රිතාන්‍ය හමුදාවේ සේවය කෙළේ ය. 1817 නිදහස් සටන ආරම්භ වූ විට බ්‍රිතාන්‍යයන් එය මර්දනයට කිරීමට යැව්වේ කැප්පෙටිපොළ දිසාව ය. එහෙත් වෙල්ලස්සට ගිය එතුමාට කරුණු පැහැදිලි කර දීමට සිංහලයෝ සමත් වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස එතුමා බ්‍රිතාන්‍යයන්ගේ සේනා හා ආයුධ ආපසු යවා සිංහල සේනාවට නායකත්වය දීමට ඉදිරිපත් විය. කෙසේ හෝ මේ නිදහස් සටන ඉතා දරුණු ලෙස මර්දනය කරනු ලැබිණි. බ්‍රිතාන්‍යයෝ ඌව වෙල්ලස්සේ සිංහලයන් සමූලඝාතනය කළහ. ඉන්පසු සිංහලයන්ට සාම්ප්‍රදායික නායකයෝ නැති වූහ.

සිංහල සාම්ප්‍රදායික නායකයන්ගෙන් සමහරු ඝාතනය කරනු ලැබූ අතර අනෙක් පිරිස බ්‍රිතාන්‍යයන් විසින් තාන්න මාන, වතු පිටි ආදිය ලබා දී තම පැත්තට ගනු ලැබූහ. මෙසේ තම පැත්තට ගනු ලැබූ නායකයන් හැරෙන්නට තවත් නායකයන් පිරිසක් බ්‍රිතාන්‍යයෝ ඇතිකළහ. සිංහලයන්ගේ නායකයන් පත්කර ගත්තේ සිංහලයන්ට අවශ්‍ය පරිදි නොව බ්‍රිතාන්‍යයන්ට අවශ්‍ය ආකාරයට ය! මේ අළුත් නායකයෝ බ්‍රිතාන්‍යයන්ට ගතු කී සුළු නිලධාරීහු වූහ. ඔවුන්ට අක්කර දහස් ගණනක් ඉඩම් බ්‍රිතාන්‍යයන්ගෙන් ලැබිණි. ඉඩම් හිමි වැවිලිකරුවන් යන කොටස ඇති වුණේ මොවුන්ගෙනි. ඉංගිරිසි කතාකරන ඇංග්ලිකන් ක්‍රිස්තියානි භක්තිකයන් වූ මොවුහු ස්වදේශිකයන් අතර ඉහළම පදවිවලට පත්වූහ. මහමුදලි තනතුරු හිමි වූයේ මොවුන්ට ය. 1835 කොළඹ ඇකඩමිය ද (පසුව රාජකීය විද්‍යාලය) ඉන් පසුව ශාන්ත තෝමස් හා ත්‍රිත්ව විද්‍යාල ද ඇතිකරනු ලැබුයේ මොවුන්ට අවශ්‍ය අධ්‍යාපනය ලබාදීම සඳහා ය. ඒ පංතියට අයත් නොවූ දක්ෂ බුද්ධිමත් සිසුන් මේ පාසල්වලට ද ඒ හරහා බ්‍රිතාන්‍යයන්ට සේවය කරන පංතියට ද ඇතුළත් කර ගැනීම සඳහා ශිෂ්‍යත්ව ඇතිකරනු ලැබිණි. මේ පාසල්වල ඉගෙන ගත් අයට "සුදුසු" භාර්යාවන් ලබා දීම සඳහා බිෂොප් හා කාන්තා විද්‍යාල පිහිටුවනු ලැබිණි.

© Prof. Nalin De Silva

1817 සිංහල සාම්ප්‍රදායික නායකත්වය නැති කරනු ලැබීමෙන් පසුව 1848 නිදහස් සටනට නායකයන් සොයා ගැනීමට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස මොරටුවෙන් හා පෑලියගොඩින් ගිය පුරං අප්පු හා ගොංගාලේගොඩ බණ්ඩා නායකත්වයට පත්වූහ. එහෙත් ඒ නිදහස් සටන් බ්‍රිතාන්‍යයින් විසින් මර්දනය කරනු ලැබිණි. නායකත්වයක් නැති වුව ද සිංහල බෞද්ධයෝ තම අධිරාජ්‍ය විරෝධී අරගලය අත් නොහැරියහ. එහි දී ඔවුන්ට මාර්ගෝපදේශකයාණන් වූයේ භික්ෂූන් වහන්සේ ය. එය 19 වැනි සිය වසේ ආරම්භ වූවක් නොවේ. දුටු ගැමුණු රජුගේ සිංහල බුද්ධාගමේ භික්ෂූන් වහන්සේ ජාතියේ මුර දේවාතාවෝ වූහ. බ්‍රිතාන්‍යයෝ මේ ගිහි පැවිදි සම්බන්ධය තේරුම් ගත්හ. බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයන්ට හිසරදයක් වූයේ භික්ෂූන් වහන්සේ ය. උන් වහන්සේ සිංහල බෞද්ධයන්ගේ ජීවිතයට සම්බන්ධ වූහ. උත්පත්තිය, මරණය ආදී සෑම අවස්ථාවක ම භික්ෂූන් වහන්සේ සිංහල බෞද්ධයන්ට අවවාද අනුශාසනා කළහ. බ්‍රිතාන්‍යයින් භික්ෂූන් වහන්සේ හැඳින්වූයේ කහ හමුදාව ලෙස ය. මේ කහ හමුදාව සිටින තාක් සිංහල බෞද්ධයන් බ්‍රිතාන්‍ය කිරීටයට පක්ෂපාත කරගත නොහැකි බව බ්‍රිතාන්‍යයෝ දැන සිටියහ.

එබැවින් භික්ෂූන් වහන්සේගේ බලය සිඳ උන්වහන්සේ තම පැත්තට නම්මා ගැනීම සඳහා බ්‍රිතාන්‍යයෝ විවිධ උපක්‍රම අනුගමනය කළහ. නායක පදවි, විහාරාධිපති පදවි හා වෙනත් පදවි ඇති කිරීමෙන් භික්ෂූන් වහන්සේ නම්මා ගැනීමට බ්‍රිතාන්‍යයෝ කටයුතු කළහ. මහානායක පදවිය ලැබීම වෙනුවෙන් පිරිනමන අක්තපත්‍රයට අනුව බ්‍රිතාන්‍යයින්ට පක්ෂපාති වීමටත්, ඔත්තු සැපයීමටත් මහානායක හිමිපාණන් වහන්සේලා බැඳී සිටියහ. ඒ අතර සිංහල බෞද්ධයන්ට වැට කඩොළු බැඳීමට, ඔවුන්ට හිරිහැර කිරීමට බ්‍රිතාන්‍යයෝ කටයුතු කළහ. සිංහල බෞද්ධයනට තම ආගමික වතාවත් කර ගැනීමට බාධා පැමිණවීමට බ්‍රිතාන්‍යයෝ වග බලාගත්හ.

දහනම වැනි සියවසේ අග භාගයේ සිංහල බෞද්ධ පුනරජීවනය ඇති වූයේ එවැනි පසුබිමක ය. මේ වන විට ඉංගිරිසි ආර්ථික ක්‍රමය තුළ ම ධනවත් වී සිටි සිංහල බෞද්ධයන් පිරිසක් ද බිහි වී තිබුණි. පතල් කර්මාන්තය, රේන්ද ලබා ගැනීම ආදිය හරහා බිහිවූ මේ පංතිය බ්‍රිතාන්‍යයින්ට ගතු කියමින්, බැළ මෙහෙවර කරමින් ඉඩම් ලබා ගනිමින් ධනවත් වූ පිරිසට වඩා තරමක් වෙනස් විය. විශේෂයෙන් ම බස්නාහිර මුහුදුබඩ තීරයෙන් පැන නැගි මේ පිරිස ඉංගිරිසි අධ්‍යාපනයක් ලබා ගත්ත ද සිංහල බෞද්ධකම නැතිකර නොගත්හ.

බටහිර යටත්විජිතවාදයේ සංරචක තුනක් වෙයි. ඒ දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික යනුවෙනි. දහනම වැනි සියවස අවසාන භාගයේ සිංහල බෞද්ධයනට වඩාත් ම දැනෙන සංරචකය වූයේ සංස්කෘතික සංරචකය ය. සිංහල බුද්ධාගමට එරෙහිව කරන ලද කෙණෙහිළි සියල්ල සංස්කෘතික යටත්විජිතවාදයට අයත් විය. එහි ප්‍රතිඵලය වූයේ එකල යටත්විජිත විරෝධී අරගලය වැඩි වශයෙන් ම සංස්කෘතික ක්ෂේත්‍රය තුල දැකගත හැකි වීම ය. දහනම වැනි සියවස අග ඇති වූ ආගමික වාද මේ සංස්කෘතික යටත්විජිතවාදයට එරෙහිව පැන නැගි අරගලයේ ප්‍රධාන කොටසක් විය. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් මෙන් ම අනගාරික ධර්මපාල තුමන් ද බිහිවූයේ එවැනි වටා පිටාවක ය. එපමණක් නොව පියදාස සිරිසේන හා ජෝන් සිල්වා ආදී මහත්වරුද මේ අරගලයේ පසුකාලීන කොටස්කරුවෝ වූහ.

එහෙත් අවාසනාවක් ම සිදු විය. ඕල්කට් තුමා මෙරටට පැමිණීමෙන් පසුව යටත්විජිත විරෝධී අරගලය වෙනතක ගමන් කිරීමට පටන් ගත්තේ ය. දුටුගැමුණු රජු සමයේ සිට පැවති සිංහල බුද්ධාගමෙන් සිංහල යන්න හැලී ගියේ ය. සිංහල බෞද්ධයන්ගෙන් ප්‍රභූ පිරිස බෞද්ධයෝ වූහ. ඕල්කට්තුමාගේ පැමිණීමෙන් පසුව ප්‍රභූන් අතර ඇති වූයේ බෞද්ධ සමිති සමාගම් හා බෞද්ධ පාසල් මිස සිංහල බෞද්ධ සමිති සමාගම් හා සිංහල බෞද්ධ පාසල් නොවේ. ඕල්කට් තුමා ද සිංහල බෞද්ධයෙක් නොවී ය. මෙහි දී ඕල්කට් තුමා සංසන්දනය කළ යුත්තේ පසු කලෙක ලංකාවට ටිබෙට් (සීකිම්) දේශයෙන් පැමිණි මහින්ද හිමියන් සමග ය. මහින්ද හිමියෝ සිංහල බෞද්ධයෙක් වූහ. සිංහල බෞද්ධයකු වන්නේ උපතින් නොව සංස්කෘතියෙනි. මහින්ද හිමියෝ සිංහල බෞද්ධ සංස්කෘතිය වැළඳ ගත්හ. ඕල්කට් තුමා සිංහල බෞද්ධ සංස්කෘතිය වැළඳ නොගත්තේ ය. එතුමා මිය යනතෙක්ම ඇමරිකන් (බෞද්ධ) පරම විඥානවාදියෙක් විය.

(මතු සම්බන්ධයි)

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva